ශීර්ෂය 179 - ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1. කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2. කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව.

## 1 කොටස

ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

---

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 284 | වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.43,650,100,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.25,253,404,835 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.58,678,260 ත් රු.18,160,371,253 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.34 ත් සියයට 47.67 ත් අතර පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 179 | 38,097,535,000 | 19,937,163,747 | 18,160,371,253 | 47.67 |
| 281 | 4,378,055,000 | 4,319,376,740 | 58,678,260 | 1.34 |
| 284 | 1,174,510,000 | 996,864,348 | 177,645,652 | 15.12 |
| එකතුව | 43,650,100,000 | 25,253,404,835 | 18,396,695,165 | |

2.2 ආදායම් ගිණුම්

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා එකතුව රු.මිලියන 17 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 17.2 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 101 ක් රැස්කර තිබුණි.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක්ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු. | රු. | රු. | |
| 20.03.02.06 | 17,000,000 | 17,250,282 | 250,282 | 1.47 |

2.3 අත්තිකාරම් ගිණුම්

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 02 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂ | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17901 | 5,000,000 | 4,428,118 | 2,200,000 | 13,136,827 | 30,000,000 | 8,899,840 |
| 28101 | 250,000,000 | 113,382,029 | 140,000,000 | 156,000,000 | 830,000,000 | 341,111,103 |
| 28401 | 44,000,000 | 33,664,318 | 28,000,000 | 32,178,008 | 140,000,000 | 122,850,630 |

2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

2.4.1 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 1,549,963 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 7002/0000/00/0418/0013/000 | 38,253 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7002/0000/00/0145/0013/000 | 1,478,852 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0088/0013/000 | 32,858 |
| එකතුව | | 1,549,963 |

2.4.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 1,779,944,481 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 6000/0000/00/0015/0188/000 | 455,093 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0136/000 | 106,817,372 |
| | 6000/0000/00/0006/0051/000 | 281,742,736 |
| | 6000/0000/00/0001/0010/000 | 25,247 |
| | 6000/0000/00/0002/0010/000 | 636,964 |
| | 6000/0000/00/0013/0024/000 | 142,419 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0139/000 | 110,286,413 |
| | 6000/0000/00/0006/0020/000 | 1,279,838,237 |
| එකතුව | | 1,779,944,481 |

2 කොටස

------------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**---------------------------------------------------**

**1. ශීර්ෂය 179 - ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය**

**---------------------------------------------------------------**

**1.1 විගණන විෂය පථය**

**---------------------**

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණය

-------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.9 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 12 ක් සඳහා සළසා තිබුණු රු.1,365,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 41 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) අග්‍රිම ගිණුම

---------------

2014 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශයේ පියවා නොතිබුණු අග්‍රිමය ශේෂය රු.29,000 ක් වූ අතර එම ශේෂය 2011 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

1.4 වත්කම් කළමනාකරණය

-----------------------------

වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

-----------------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතන | සංඛ්‍යාව |
|---|---|---|
| මෝටර් වාහන | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 01 |
| | අධ්‍යාපන අමාත්‍යාංශය | 05 |
| | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 02 |
| | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 01 |

## 1.5 අනුකූල නොවීම්

**-------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

**-------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් වැසිකිලි 08 ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ගෙවීම් කළ මුදලින් රු.457,535 ක් රඳවා ගත යුතු වුවත්, එසේ කර නොතිබුණි.

## 1.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**-----------------------------------**

2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ පිළිබඳ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයට අමතරව කළමනාකරණ සහකාර තනතුරු 01 ක් හා කාර්යාල කාර්ය සහයක තනතුරු 01 ක් සඳහා පත්වීම් ලබාදී තිබියදී, 2013 පෙබරවාරි සිට මැයි දක්වා කළමනාකරණ සහකාරවරු 05 දෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයකු සඳහා අමතර පැය 4,385 සඳහා රු. 253,483 ක මුදලක් ගෙවා තිබුණි.

## 1.7 අවිධිමත් ගනුදෙනු

**--------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වීඩියෝ කැමරා, පරිගණක, රූපවාහිණී, ශීතකරන, ඡායා පිටපත් යන්ත්‍ර හා කාර්යාල උපකරණ 2012 වර්ෂයේදී වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය විසින් රු.6,269,571 ක් ගෙවා මිලදි ගෙන තිබුණි. 2013 වර්ෂයේදී අමාත්‍යාංශ කාර්යාල නැවත සංශෝධනය කිරීම නිසා එම වත්කම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණද, එම වත්කම් ලද බව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සනාථ කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ඇතුළත බිත්ති වර්ණාලේප කිරීමේ කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුවේ විෂය අංක 03 හා 05 යටතේ වූ වැඩ කොටස් ඉටුකර නොතිබුණත් ඒ සඳහා රු.112,810 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති කාබනික පොහොර නිෂ්පාදන ඒකකවල, කාබනික පොහොර නිෂ්පාදනය වී ගොවීන් විසින් භාවිතා කිරීම දිරි ගැන්වීම සඳහා ගොවින් විසින් භාවිතා කරන යූරියා පොහොර ප්‍රමාණයට සමාන ප්‍රමාණයට එම කාබනික පොහොර ගොවින්ට නොමිලේ සපයා තිබුණි. කාබනික පොහොර නිෂ්පාදන ඒකක විසින් බෙදාහරිනු ලබන පෙහොරවලට අදාල වටිනාකම, පෙහොරවල වාණිජ මිල තීරණය

කිරීමේ කමිටුව විසින් නිශ්චය කර තිබුණි. එම මිල පදනම් කරගෙන ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති කාබනික පොහොර නිෂ්පාදන ඒකක විසින් නිෂ්පාදනය කර බෙදාහැර ඇති පොහොරවලට ගෙවීම් කර තිබුණි. එසේ අනුරාධපුරය ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් එම දිස්ත්‍රික්කයේ ගොවිජන මධ්‍යස්ථාන 20 ක කාබනික පොහොර නිෂ්පාදකයින් වෙත එකතුව රු.19,239,546 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කටියාව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කාබනික පොහොර නිෂ්පාදන ඒකකවල සාමාජිකයින් 48 ක් විසින් කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 384,143 ක් නිෂ්පාදනය කර බෙදාහැර තිබූ අතර එම බෙදාහැරීමේ ලැයිස්තු අනුව රු.3,073,144 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- යාය 10 තුලාන 385 දරන කාබනික පොහොර නිෂ්පාදන ඒකකයේ සාමාජිකයින් 09 දෙනෙකුට රු.280,476 ක් ගෙවා තිබුණි. සත්‍ය වශයෙන් එක් පුද්ගලයෙක් විසින් පොහොර කිලෝ ග්‍රෑම් 3,683.5 ක් නිෂ්පාදනය කර බෙදාහැරීම වෙනුවෙන් රු.29,468 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.251,008 ක් වැඩිපුර ගෙවා තිබුණි.
- තුලාන 396 දරන කාබනික පොහොර නිෂ්පාදන ඒකකයට අයත් ඉහළ හල්මිල්ලෑව ගොවි සංවිධානයේ සාමාජිකයන් හතර දෙනෙකුට කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 39,299.5 ක් නිෂ්පාදනය කර බෙදාහැරීම සඳහා රු.314,396 ක් ගෙවූ බව ලේඛනවල දක්වා තිබුණත්, සත්‍ය වශයෙන් කිලෝ ග්‍රෑම් 3,200 ක් පමණක් නිෂ්පාදනය කර බෙදාහැර තිබුණි. ඒ අනුව එම සාමාජිකයින්ට පොහොර කිලෝ ග්‍රෑම් 36,099.5 ක් සඳහා රු.311,196 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 20 ක කාබනික පොහොර මෙට්‍රික් ටොන් 2,404.95 ක් නිෂ්පාදනය කර බෙදාහැරීම වෙනුවෙන් රු.මිලියන 19.23 ක් ගෙවා තිබුණද, මෙම නිෂ්පාදිත පොහොර නිසි ප්‍රමිතියට නිපදවා තිබුණේද යන බව පරීක්ෂා කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 40 ක් වෙත කාබනික පොහොර උපකරණ හා යෙදවුම් සැපයීම වෙනුවෙන් රු.72,558,460 ක් වැය කර

තිබුණත්, ඉන් මධ්‍යස්ථාන 18 ක කිසිදු කාබනික පොහොර නිෂ්පාදනයක් 2014 ජුනි 30 දින වන විටත් සිදුකර නොතිබුණි.

(iv) මේ අනුව කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා වැයකළ මුදලින් අපේක්ෂිත ප්‍රගතිය කරා ලඟාවී නොතිබුණු අතර කාබනික පොහොර නිෂ්පාදන කටයුතු දිගින් දිගටම ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

## 1.8 ආර්ථික නොවූ ගනුදෙනු

2012 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ඉදිකළ තොරණේ ගලවා ඉවත් කළ කෙටස් නැවත භාරදී නොතිබුණි. 2013 වර්ෂයේදී දැයට කිරුළ ප්‍රදර්ශන වෙනුවෙන් ඉදිකළ තොරණ සඳහා ඉදිරිපත් කළ මිල ගණන් අනුව රු.50,000 ක ප්‍රවාහන ගාස්තුවක් ඇතුළත් වී තිබුණත්, ප්‍රවාහන, පැටවුම් හා බෑම සඳහා ගාස්තු වශයෙන් රු.39,000 ක් වෙනම ගෙවා තිබුණි.

## 1.9 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 42 | 38 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 25 | 25 | - |
| | | 79 | 74 | 05 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 05 ක් අමාත්‍යාංශය විසින් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදා හැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| කළමනාකරණ සහකාර | 01 | ඇමති කාර්ය මණ්ඩලය | 2013 පෙබරවාරි |
| කාර්යාල කාර්ය සහයක | 01 | ඇමති කාර්ය මණ්ඩලය | 2013 පෙබරවාරි |

**(ඇ) විනය කාර්යපරිපාටි පුහුණුව**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින්, ඉහළ කළමනාකරුවන් හා රාජ්‍ය සේවයේ අධිශ්‍රේණි නිලධාරීන් ඉලක්ක කර ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර සේවාවන් හි ii හා iii ශ්‍රේණිවල නිලධාරීන් සඳහා විනය කාර්ය පරිපාටි පුහුණුවක් 2013 අප්‍රේල් 22 දින සිට 24 දින දක්වා පවත්වා තිබුණි. ඉහත තනතුරුවලට අදාල නොවන සංවර්ධන සහකාරවරුන් දෙදෙනෙකු හා කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකුද එම පුහුණුව සඳහා සහභාගි කරවා තිබුණි.

## 2. ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 09 දින කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා

පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් 2014 මාර්තු 31 දින වන විට පහත සඳහන් පරිදි ගොවිජන සංවර්ධන සභාවල ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| වර්ෂය | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2006 | 32 |
| 2007 | 32 |
| 2008 | 36 |
| 2009 | 59 |

| | |
|---|---|
| 2010 | 56 |
| 2011 | 64 |
| 2012 | 109 |
| 2013 | 205 |

**(ආ) අග්‍රිම ගිණුම**

------------

මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරියෙකු වෙත අවස්ථා 04 කදී එකතුව රු.2,167,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 28101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.22,612,243 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) කේවල ශේෂ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී රු.678,192 ක වෙනසක් විය. මෙම වෙනස තුළ 2007 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ සාරාංශයන්ගේ වෙනස වූ රු.189,178 ක්ද, සමාලෝචිත වර්ෂය අවසානයට හඳුනා නොගත් හර ශේෂය රු.2,049,291 ක්ද, හඳුනා නොගත් බැර ශේෂය රු.1,560,277 ක්ද අන්තර්ගත වී තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ජේදයේ 4 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු නොකළ විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය අවසන් කළ නිලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.13,643,691 ක් වු අතර, එම ශේෂ තුළ වර්ෂ 5 ට වඩා වැඩි රු.5,255,012 ක ණය ශේෂ පැවැතුණි.

(iv) විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.4,362,950 ක් වු අතර එයින් රු.1,155,948 ක මුදලක් නිලධාරින් 20

දෙනෙකුගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකරගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රඳවාගෙන තිබුණි. මේ සඳහා ප්‍රතිපාදන 2013 දෙසැම්බර් 31 දින වන විටද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනිමට අපොහොසත් වී තිබුණි.

(v) පළාත් සභාවලට හා ප්‍රාදේශිය සභාවලට තරඟ කොට තේරි පත් වූ මන්ත්‍රීවරුන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.55,110 ක ණය ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(vi) පළාත් සභා නිලධාරින් ලෙස අන්තර්ග්‍රහණය කළ ගොවිජන සේවා නිලධාරින්ගෙන් අයවිය යුතු රු.486,944 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණය ශේෂයන් මාස 03 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ වසර 6 ට වැඩි කාලයක් මුළුල්ලේ නිරවුල් කර නොතිබූ ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණය ශේෂ එකතුව රු.5,809,595 ක් ද, ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගේ ණය ශේෂ එකතුව රු.20,273 ක්ද 2013 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(viii) 2012 වර්ෂයේ පාලන ගිණුමේ දක්වා තිබූ රු.2,772,758 ක් වූ ණය ශේෂ 2013 වර්ෂයේ පාලන ගිණුමෙන් ඉවත් කර තිබුණු අතර, එම ණය ශේෂ නිරවුල් කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන නමුත් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු අභ්‍යන්තර විගණනයෙන් ආවරණය කර නොතිබුණි.

**2.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

දෙපාර්තමේන්තුව සතු වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර සූත්‍ර 30 ක් වර්ෂ 2 ත් 10 ත් අතර කාල පරාසය තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 75 ක් අබලන්ව පැවැතුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් වර්ෂ 15 කට වඩා වැඩි කාලයක සිට අවිධිමත් ලෙස භාවිතා කර තිබුණත්, එම වාහන අමාත්‍යාංශයට ආපසු භාර දීමට හෝ දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට 2014 මාර්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**2.6 අනුකූල නොවීම්**

**----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
| --- | --- | --- |
| | රු. | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | |
| 43 වගන්තිය | - | ගොවි සංවිධාන 1,846 ක් 2014 අගෝස්තු 31 දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. |
| 56 වගන්තිය | 1,054,554 | සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර අක්කර බදු අයකර ගත යුතු වුවත්, 2014 නොවැම්බර් 20 දින වන විට හිඟහිටි බදු ප්‍රමාණය රු.1,054,554 ක් විය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 237 (අ) | 24,704,195 | මොණරාගල සංවර්ධන සභා 03 ක් විසින් තොග සහතික ලබා නොගෙන ගෙවීම් සහතික කර කර තිබුණි. |
| (ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | | වාහන වල ඉන්ධන දහනය සෑම මාස 6 කට වරක්ම පරික්ෂා කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |
| (ඈ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>------------------------- | | |
| | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන චක්‍රලේඛය | | දෙපාර්තමේන්තුවේ ගර්හිත තත්ත්වයේ පැවති වාහන, කෘෂි උපකරණ, යන්ත්‍ර හා ට්‍රැක්ටර් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඊ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>----------------------------------- | | |
| | (i) 9.3.1(ආ) මාර්ගෝපදේශය | | ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව රු.200,000 වැඩි අළුත්වැඩියාවන් කිරිම සම්බන්ධයෙන් අවස්ථා 5 කදී රේඛිය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (උ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ**<br>---------------------------------- | | |
| | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන (ගොවි බැංකු) චක්‍රලේඛයේ 4.4.2 ඡේදය | 59,605,855 | ගොවිජන බැංකුවට ලබාදී තිබුණු ප්‍රාග්ධන මුදල් වර්ෂ 5 ක් තුළ ආපසු ගෙවිය යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දිනට ගොවි බැංකු 24 ක් විසින් ආපසු නොගෙවූ හිඟ ප්‍රාග්ධන මුදල රු.59,605,855 ක් විය. |

**2.7 සැලැසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ගාල්ල, යක්කලමුල්ල පොහොර ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා රු. 582,707 ක් වැය කර තිබුණත්, එය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදි දිස්ත්‍රික්ක 4 ක් ඉලක්ක කර ගනිමින් පරිගණක මෘදුකාංග මිලදි ගැනිමට සැලැසුම් කර තිබුණත්, 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් මිලදි ගෙන තිබුණි.

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | 81,776 | 53,729 | 9,675 | 145,180 |
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 1,809,387 | 290,270 | 600 | 2,100,257 |
| (iii) හඳුනා නොගත් හර | - | 376 | 15,475 | 15,851 |
| (iv) හඳුනා නොගත් බැර | | 1,249 | 14,625 | 15,874 |

## 2.9 පාඩු හා හානි

--------------

සමාලෝචිත වර්ෂය තුළ වාහනයක් අවස්ථා 2 කදී අනතුරුවලට ලක්ව් තිබු අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.10 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) කහතුඩුව ගොවිජන සංවර්ධන නිලධාරි විසින් එම ගොවිජන සංවර්ධන සභාවේ කුවිතාන්සි පොත් අස්ථානගතවීමක් සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ගෙන් ලිඛිත ප්‍රකාශ ලබා ගෙන 2011 මැයි 28 දින කොළඹ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යවා තිබුණද, 2014 අගෝස්තු 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යන්ත්‍ර කුලියට දීමෙන් ලැබෙන ආදායම ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කිරිමේදී ඒ ඒ දිස්ත්‍රික්ක විධිමත් හා ඒකාකාරී ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. දිස්ත්‍රික් කාර්යාල යන්ත්‍ර කුලියට දීමෙන් එකතුවන ආදායම ඊට පසු මාසයේදී ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කරවා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2003 අගෝස්තු 19 දිනැති අංක 14/2003- (ගොවිජන බැංකු 09/2003) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ගොවි බැංකුවල මාසික ඒකාබද්ධ වාර්තා ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි. කොළඹ දිස්ත්‍රික්කයේ පවතින ගොවි බැංකු 8 හි ඒකාබද්ධ වාර්තා 2011 දෙසැම්බර් මාසයෙන් පසුව ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර, ගොවි බැංකු 532 න් 2013 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ වාර්තා එවා නොතිබුණු ගොවි බැංකු සංඛ්‍යාව 311 ක් විය.

(ඈ) උතුරු නැගෙනහිර පළාත්වල කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරු 343 ක් බඳවා ගැනිම සඳහා 2010 වර්ෂයේදි සම්මුඛ පරික්ෂණ පවත්වා තිබුණි. ඒ සඳහා රු.4,542,044 ක් වැය කර තිබුණු අතර කාර්ය මණ්ඩලය 2014 නොවැම්බර් 19 දින වන විටත් බඳවා ගෙන නොතිබුණි.

(ඉ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ යකල්ල, රනෝරාව හා මරදන්කඩවල යන ගොවිජන සංවර්ධන සභාවල 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ හඳුනා ගන්නා ලද එකතුව

රු.5,062,645 ක්වූ පොහොර තොග ඌනතා සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට 2014 නොවැම්බර් 19 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී රු.774,400 ක් වැයකර වාහනයක් අළුත්වැඩියා කර ගෙන තිබුණි. වර්ෂ 1 ක වගකීම් කාලය සැලකිල්ලට නොගෙන පළමු අළුත්වැඩියාව සිදුකළ ආයතනයෙන්ම රු.539,680 ක් වැය කර නැවත වරක් අළුත්වැඩියා කර තිබුණි.

(උ) නුවරඑළිය සහකාර කොමසාරිස් නිල නිවාසය ලබා දි තිබු නිලධාරියා 2010 දෙසැම්බර් 31 දින සිට වැඩ තහනමට ලක් වි තිබුණි. 2014 ජුලි 14 දිනය වන විටත් ඔහු එම නිල නිවාසය භාරදිමට කටයුතු කර නොතිබුණු අතර එම කාලපරිච්ඡේදය සඳහා නිවාස කුලි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 59 | 48 | - |
| (ii) | තෘතියික මට්ටම | 645 | 434 | 211 | - |
| (iii) | ද්විතියික මට්ටම | 14,248 | 11,634 | 2,614 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 425 | 278 | 147 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 178 | - | 178 |
| | එකතුව | 15,425 | 12,583 | 3,020 | 178 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 3,020 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 ජනවාරි 08 දිනැති අංක DMS/G2/56/01(Vel-1) දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් තනතුරු 12,873 ක් අනුමත කර තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 15,425 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) වෙනත් අමාත්‍යාංශවලින් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබූ සංවර්ධන සහකාරවරුන් 116 ක් ද, කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර 62 ක්ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවා තිබුණි. මෙම නිලධාරීන් 178 ක ප්‍රමාණය දෙපාර්තමේන්තුව විසින් තථ්‍ය සේවක සංඛ්‍යාව යටතේ දක්වා තිබුණි.

3. ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

---

3.1 විගණන විෂය පථය

---

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 02 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 3.4 සිට 3.10 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

සේවය අත්හිටවූ නිලධාරීන් 24 දෙනෙකුගෙන් අය විය යුතු රු.745,631 ක් හා සේවය හැරගිය නිලධාරීන් 29 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,530,637 ක ණය ශේෂ සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) ප්‍රතිපාදන ඉක්මවා උපයෝජනයන් කිරිම

-----------------------------------------------

වැය විෂයයන් 11 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනය එකතුව රු.17,523,281 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය කර තිබුණි.

(ඇ) අයවැය විචලනය

--------------------

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 58 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

------------------------------------------

විෂය අංක 28401 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,445,535 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 02 ක් ඉක්මවූ රු.28,313,641 ක් වූ තැන්පතු 141 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ව්‍යාපෘති අරමුදල් සම්බන්ධයෙන් ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වසර දෙකකට පසු ඉකුත් තැන්පතු වශයෙන් සළකා නියාදනය කළ යුතු වුවත්, එකතුව රු.807,463 ක්වූ අවස්ථා 10 කට අදාල තැන්පතු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(iii) උතුර පළාත් ක්‍රමෝපායික පාරිසරික ඇගැයිම් ව්‍යාපෘතිය සඳහා ලබා දුන් රු.930,000 කින් ක්ෂේත්‍ර පරික්ෂණ වියදම් හැර ඉතිරි වූ රු.535,700 ක් රජයේ ආදායමට නොගෙන එකි අංශයේ උපකරණ මිලදී ගැනිමට යොදවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතු මෝටර් වාහන 22 ක් වර්ෂයක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ii) පළටුපාන කාර්යාල පරිශ්‍රයේ පවත්වා ගෙන ගිය ආපන ශාලාව වසා දැමීම නිසා එම ගොඩනැගිල්ල කැඩී විනාශ වෙමින් පැවැතුණි.

(iii) බුතව සංචාරක බංගලාව ආසන්නයේ පිහිටි යුධ හමුදාව විසින් පාවිච්චි කර දැනට අතහැර දමා තිබුණු ගොඩනැගිල්ල අළුත්වැඩියා කර සංචාරක බංගලාවක් වශයෙන් වැඩි දියුණු කිරිමට කටයුතු කර නොතිබුණි. තවද, ගොඩනැගිල්ල තුළ ගෘහ උපකරණ විශාල ප්‍රමාණයක් තිබුණු අතර ඒවා ගණනය කර පොත්වලට ගැනිමට කටයුතු කර නොතිබුණු අතර සමහර උපකරණ විනාශ වෙමින් පැවැතුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

------------------------------------------

2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ස්ථාන 20 ක තිබුණු භාණ්ඩ ඒකක 12,971 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| (i) 1970 අංක 01 දරන හා 1993 අංක 49 දරන පනත්වලින් සංශෝධිත 1964 සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 අධිකාරය) හා 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ 23(1) හා 22(අ)(1) වගන්ති | - | අලියෙකු හෝ ඇතෙකු බලපත්‍රයක් රහිතව ලඟ තබා ගැනීම නීති විරෝධී වුවද, උඩවලව හා හබරණ ප්‍රදේශවලින් අල්ලාගත් අලි පැටවුන් 22 ක් නීති විරෝධී ලෙස විවිධ ව්‍යාපාරිකයින්, දේවාලවල හා විහාරස්ථානවල රඳවා ගෙන තිබුණි. |
| (ii) 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත | | |
| • 6 වගන්තිය | - | කිසිම තැනැත්තෙකු විසින් ජාතික රක්ෂිත භූමියක මායිමේ සැතපුම් එකක් දුරක් ඇතුළත සංචාරක හෝටල් ඉදිකිරීම තහනම් වුවද, මින්නේරිය ජාතික උද්‍යානයේ මායිමේ සිට මීටර් 150 ක් දුරින් ප්‍රේරක කලාපය තුළ හෝටල් සඳහා දෙමහල් ගොඩනැගිලි 06 ක් ඉදිකර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | • 9(අ) වගන්තිය | - | මුලික පරිසර සමීක්ෂණ වාර්තාවක් හා පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් ලබා ගැනිමකින් තොරව වන සතුන් ගැවැසෙන සංවේදී කලාපයක ගොඩනැගිලි 06 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 104 | - | 2013 වර්ෂය තුළ අවස්ථා 06 කදී හා 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 15 කදී සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් අලාභයේ තරම නිශ්චය කර ප්‍රාරම්භක වාර්තා පිලියෙල කිරිමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 115 | 1,452,328 | වර්ෂ දෙකකට පෙර මිලදී ගත් දැව කණු තොගයක් සඳහා රු.1,452,328 ක් 2013 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | 9.3.1(ආ) මාර්ගෝපදේශය | 125,000 | මිල ගණන් කැඳවීමකින් තොරව වාහනයක් අළුත්වැඩියා කර තිබුණි. |

3.6 කාර්යසාධනය

-----------------

ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විදුලි වැට ඉදිකිරීම් සඳහා රු.192,700,000 ක් වෙන්කර තිබූ අතර තථ්‍ය වියදම රු. 199,248,727 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.6,548,727 ක් විදුලි වැට ඉදිකිරීම් සඳහා වැය කර තිබුණි.

(ii). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විදුලි වැට ඉදිකිරීම් හා එළිපෙහෙළි කිරීමට අදාලව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට රු.65,528,703 ක් ලබාදී තිබුණද, ඒ සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii). එළිපෙහෙළි කිරීමේ කටයුතු සඳහා ලබාදී තිබූ රු.65,528,703 කින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.9,630,322 ක් හෙවත් ලබාදුන් මුදලින් සියයට 15 ක් පමණක් වියදම් කර තිබුණි. ඉතිරි මුදල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. මේ අනුව විදුලි වැට ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳව වනජීවී දෙපාර්තමේන්තුව පසු විපරම් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iv). 2012 වර්ෂයේ අවිච්ඡේද විදුලි වැට 07 ක් ද, 2013 වර්ෂයේ නව වැඩ යටතේ විදුලි වැට 11 ක් ද, 2013 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ විදුලි වැට 10 ක් ද, 2013 වර්ෂයේ වෙනත් වැඩ යටතේ විදුලිවැට 22 ක් ද වශයෙන් කිලෝමීටර් 1,020 ක් වූ විදුලි වැටවල් 50 ක් ඉදිකිරීමට සැලැසුම් කර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දින වන විට කිලෝමීටර් 252.35 ක් වූ වැටවල් 21 ක් පමණ ඉදිකර තිබුණි. තවද, 2014 මැයි 15 දින වන විට මුළු කාර්යසාධනය කිලෝමීටර් 490.5 ක් දිග විදුලි වැටවල් 33 ක් පමණක් ඉදිකර තිබුණි. මේ අනුව ඉදිකිරීම් ප්‍රගතිය 2013 දෙසැම්බර් 31 දිනට සියයට 25 ක් ද, 2014 මැයි 15 දිනට සියයට 48 ක් ද වි තිබුණි. තවද 2014 මැයි 15 දිනට සම්පූර්ණයෙන් වැඩ නිම කළ විදුලි වැටවල් ගණන 14 ක් පමණක් විය.

(v). 2012 වර්ෂය තුළ යෝජිත විදුලිවැට 10 ක කිලෝමීටර් 155.4 ක ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 28.4 ක් වැයකර උපකරණ මිලට ගෙන තිබුණද, එම උපකරණ උපයෝජනය කරමින් අදාල විදුලිවැට 2012 හෝ 2013 වර්ෂය තුළ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi). විදුලි වැට එළිපෙහෙළි කිරීම හා විදුලි වැට ඉදිකිරීම එකිනෙකට සමගාමීව කළ යුතු වුවද, විදුලි වැට එළිපෙහෙළි කිරීම සඳහා රු.8,251,759 ක වැයකර තිබුණද, කිලෝමීටර් 245 ක් දිගැති විදුලි වැටවල් 10 ක් ඉදිකර නොතිබුණි. මේ අනුව විදුලි වැට කඩිනමින් ඉදි නොකිරීම හේතුවෙන් නැවත කැලෑව වැවීමට ඉඩ ඇති

බවද, විදුලි වැට ඉදිකිරීම සඳහා එළිපෙහෙලි කිරීමේ වියදම් නැවත නැවත දැරීමට සිදුවිය හැකි බවත්, එම නිසා ඉහත සඳහන් වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

(vii). දැයට කිරුළ ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර තිබූ රු.49,100,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු විදුලි වැට 07 ක ඉදිකිරීම් ඉටුකර නොතිබුණි.

(viii). විදුලි වැට උපකරණ මිලදී ගැනිම සඳහා 2013 වර්ෂයේදී රු.104,918,100 ක් වැය කර තිබුණු නමුත්, එම උපකරණ සඳහා ඉන්වෙන්ටරි ලේඛන පවත්වා නොතිබුණු අතර භෞතික තොග ගණනයක්ද සිදු කර නොතිබුණි. මේ නිසා එක් එක් විදුලි වැට සඳහා කොපමණ විදුලි කණු ප්‍රමාණයක් භාවිතා කර තිබේද යන්න තහවුරු කර ගැනිමට නොහැකි වි තිබුණි.

(ආ) අලි වැටවල් ඉදිකිරීම් පිළිබඳ භෞතික පරීක්ෂාව

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අන්දරවැව උස්ගල විදුලිවැට නඩත්තු කටයුතු

------------------------------------------------

කි.මි 10 ක දිගකින් යුත් මෙම විදුලිවැට රාජ්‍ය නොවන සංවිධානයකින් ඉදිකර තිබුණු අතර එය නිසි ප්‍රමිතියෙන් තොරවීම නිසා නැවත ඉදිකිරීම සඳහා අවශ්‍ය උපකරණ 2013 ජුනි මාසයේදී සිවිල් ආරක්ෂක බලකාය වෙත ලබාදී තිබුණි. 2014 ජුනි 23 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී මෙම වැට අළුත්වැඩියා කිරීමට වසරකට වැඩි කාලයක් ගතකර තිබූ නමුත් සම්පූර්ණයෙන් අළුත්වැඩියාව අවසන්කර නොතිබුණි. වැටෙහි කණු 17 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී බෝල්ට් ඇණ 04 බැගින් යොදා සම්බන්ධ කිරීමට ඇණ (17 x 4) 68 ක් යෙදිය යුතු වුවත්, යොදා තිබුණේ ඇණ 50 ක් පමණි. විදුලි වැටවල් තුනක වෝල්ටීයතාව මැනීම සඳහා සිවිල් ආරක්ෂක භටයන්ට සපයා තිබූ මීටරය අක්‍රීය වී තිබුණි.

(ii) කිරිදිඔය සිට දෙමෝදර දක්වා විදුලිවැට

---------------------------------------------

මෙම වැට කි.මී 06 ක් හැරුණු විට ඉතිරි විදුලි වැටේ කොටස් සම්පූර්ණයෙන්ම බිම පතිත වී තිබුණ අතර නඩත්තුව සඳහා ප්‍රමාණවත් භට පිරිස් යොදවා නොතිබුණි. මෙම වැට අළුත්වැඩියා කර නොතිබීමෙන් රණවරාව වැව ආශ්‍රිත කැලෑ ප්‍රදේශය, විදුලි වැටෙන් ඇතුළත (ගම්මාන තුළ) හා විදුලි වැටෙන් පිටත ප්‍රදේශවලත් අලි ගැවසෙනු නිරීක්ෂණය විය. අලින් විසින් ගොවි බිම්, නිවාස හා දේපළ හානි සිදුකර තිබුණි.

(iii) හඳපානගල - ආනපල්ලම විදුලිවැට ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම

---------------------------------------------------------------------

කි.මී 30 ක් දිගින් යුතු හඳපානගල - ආනපල්ලම විදුලිවැට ඉදිකිරීම සඳහා වැටකණු උපකරණ 2013 ඔක්තෝබර් 07 දින සපයා තිබුණු අතර කි.මී 30 වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2013 සැප්තැම්බර් 09 දින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි. එසේ වුවත් මාස 22 කට අධික කාලයක් ගතවී තිබුණත්, ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. ඉදිකර තිබුණු විදුලි වැටවල් නියමිත ප්‍රමිතියට ඉදිකර නොතිබුණු බව නිරික්ෂණය විය.

විදුලි වැටක තිබිය යුතු වෝල්ටීයතාවය 12 ක් වුවත් 2014 ජුලි 31 දින ප.ව 5.50 ට පමණ සිදුකළ පරීක්ෂාවේදී වැටේ පැවති වොල්ටීයතාවය 3.7 ක් වැනි අඩු මට්ටමක පැවතුණි. කම්බි එකිනෙක පටලවා ඇති අයුරු හා වැට මාර්ග එලිපෙහෙලි කිරීම දුර්වල මට්ටමක පැවතීම ඊට හේතු වූ බව සෝදිසි පරීක්ෂාවේදී අනාවරණය විය.

(iv) කිරිදිඔය සිට කුඹුක්කන් ආර දක්වා වූ දෙමලිය විදුලිවැට

---------------------------------------------------------------

2014 ජුලි 30 දින මෙම විදුලිවැට පරීක්ෂා කිරීමේදී කිරිදිඔය සිට කි.මී 06 ක පමණ කොටස හැර ඉතිරි කොටස සම්පූර්ණයෙන්ම බිඳවැටි තිබුණි. වැට පැවති කි.මී 06 ක ප්‍රමාණයද කැළය වැවී විදුලි කම්බි මතට පතිත වි තිබුණු අතර සමහර ස්ථානවල කම්බි පොළවට ස්පර්ශවන මට්ටමට තිබුණි. සමහර ස්ථාන වල Earth වයරය නොතිබු අතර කිරිදිඔය අසල විදුලි කම්බි ගස්වල ගැටගසා තිබුණු බව නිරීක්ෂණය විය.

මෙම විදුලි වැට බිඳ වැටීම නිසා අවට ප්‍රදේශයේ ජනතාවගේ වගාවන් සම්පූර්ණයෙන්ම පාහේ අලීන් විසින් පාළුකර තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව නිරන්තරයෙන් වනජීවි දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කළත් ඒ පිළිබඳ වනජීවි දෙපාර්තමේන්තුව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(v) අන්නාසිගල සිට අයිස්පීල්ල දක්වා විදුලි වැට ඉදිකිරීම

-------------------------------------------------------------

2014 ජුලි 23 දින වන විට මෙම විදුලිවැටෙහි කි.මී 17 ක් අවසන් කර තිබුණත් ඉතිරි කිලෝමීටර් 20 ක ඉදිකිරීම් කටයුතු ඉඩම් ආරවුලක් මත අතර මග ඇණහිට තිබුණි. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදී තිබු විදුලිවැට

උපකරණවලින් කොපමණ ප්‍රමාණයක් පාවිච්චි කර තිබුණේද හා කොපමණ ප්‍රමාණයක් ඉතිරිව තිබුණේද යන්න වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවට ලක්කර නොතිබුණි. මෙම උපකරණ නිෂ්කාර්යව පැවති අතර වනජීවී දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ප්‍රමාණයට නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(vi) ආයකපොල්ල සිට හුලන්දාව දක්වා කි.මී 40 ක විදුලි වැට ඉදිකිරීම

---------------------------------------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව විදුලිවැට ඉදිකිරීම සඳහා දැරූ සම්පූර්ණ වියදම රු.19,827,341 ක් වූ අතර එයින් විදුලි වැට ඉදිකිරීමට හා වැට මාර්ගය පිළියෙල කිරීමට රු.6,667,322 ක් 2013 ජූලි 07 දින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට මුදාහැර තිබුණි. මෙම විදුලිවැට ආයකපොල්ල සිට හෙල්ගම දක්වා කි.මී 10 ක්ද, හෙල්ගම සිට වැලිආර දක්වා කි.මී 10 ක්ද, වැලිආර සිට දේවාල මංකඩ දක්වා කි.මී 10 ක්ද, දේවාල මංකඩ සිට හුලංදාව දක්වා කි.මී 10 ක්ද, ඉදිකිරීමට සැලැසුම්කර තිබුණද පිළිවෙලින් කි.මී. 07,01 හා 01 ක් වශයෙන් කි.මී. 09 ක් පමණක් ඉදිකර තිබු අතර දේවාලමංකඩ සිට හුලංදාව දක්වා විදුලි වැට ඉදිකර නොතිබුණි.

ආයකපොල්ල සිට මහවෙල්ගල දක්වා කි.මී 4 ½ ප්‍රමාණයක් ප්‍රජා දායකත්වය යටතේ ඉදිකර තිබුණු අතර එය නොසළකා ආයකපොල්ල සිට විදුලිවැට ඉදිකරන බවට ඇස්තමේන්තු කර වියදම් කර තිබුණි. මේ අනුව දැනටමත් ඉදිකර තිබුණු කි.මී 4 ½ විදුලි වැට වෙනුවෙන් දෙවරක් වියදම් කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(vii) ප්‍රමිතියෙන් තොර විදුලි වැට කණු සපයා තිබීම

-----------------------------------------------------

රාජ්‍ය දැව සංස්ථාව විසින් ඉදිකර තිබුණු විදුලි වැට කණුවල ප්‍රමිතිය පිළිබඳව ඌව සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වල්ලිඅම්මාර අඩවි කාර්යාලයේ පැවති වැට කණු සම්බන්ධයෙන් කළ සෝදිසි පරීක්ෂාවේදී සපයා තිබුණු සමහර කණුවල වට ප්‍රමාණය නියමිත ප්‍රමිතිය තුළ නොතිබු බව නිරීක්ෂණය විය.

(viii) විදුලි වැට ඉදිකිරීමට පෙර අවස්ථා දෙකකදී වියදම් දැරීම

---------------------------------------------------------------

ආයකපොල්ල සිට දේවාල මංකඩ දක්වා කි.මී 17 ක් විදුලි වැට ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේදී ඇස්තමේන්තු සකසා විදුලි වැට උපකරණ මිලදීගෙන තිබුණු නමුත් 2010 සැප්තැම්බර් වනතුරුත් මෙම විදුලිවැට ඉදිකර නොතිබුණි. එසේ තිබියදී 2010 ජුලි මස නැවත වරක් ආයකපොල්ලේ සිට මහවෙල්ගල දක්වා කි.මී 07 ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකසා තිබුණි. මෙම විදුලි වැට සඳහා උපකරණ මිලදීගෙන, එම උපකරණ නිකුත් කර තිබුණත් විදුලිවැට ඉදිකර නොතිබුණි.

2010 ජුලි මස ආයකපොල්ල සිට මහවෙල්ගල දක්වා කි.මී 7 ක් විදුලි වැට ඉදිකිරීම සඳහා විලඔවැව හා දහයියාගල විදුලිවැට ඉදිකිරීමට ගෙනා විදුලිවැට උපකරණ යොදා ගැනීමට කටයුතු කර තිබුණි.

නමුත් ආයකපොල්ල සිට දේවාල මංකඩ දක්වා කි.මී 17 ක් හො ආයකපොල්ල සිට මහවෙල්ගල දක්වා කි.මී 7 ක් ඉදිකර නොතිබුණු අතර 2012 වර්ෂයේදී ප්‍රජාදායකත්වය යටතේ විදුලිවැට කි.මී 4 ½ ක ප්‍රමාණයක් ඉදිකර පැලවත්ත සීනි සමාගමට අයත් විදුලි කුටියකින් විදුලිය සපයා තිබුණි.

(ix) නියාමනයකින් තොර පෞද්ගලික විදුලිවැටවල් පැවතීම

---------------------------------------------------------------

විදුලිවැට ඉදිකිරීම පිළිබඳව කළ භෞතික පරීක්ෂාවලදී ඇතැම් ප්‍රදේශවල පුද්ගලයන් විසින් සිය වගාබිම් වටා අනවසර විදුලි වැටවල් ඉදිකර තිබෙණු නිරීක්ෂණය වූ අතර එවැනි වැටවල් සඳහා බලශක්තිය ලබාගන්නා ප්‍රභවය කුමක්ද යන්න හා පවත්නා වෝල්ටීයතාවය සම්මත ප්‍රමිතිය තුළ පිහිටන්නේද යන්න පිළිබඳ පරීක්ෂාවක් හෝ නියාමනයක් සිදු නොකරන බව අනාවරණය විය. මෙවැනි පෞද්ගලික විදුලිවැට හේතුවෙන් අලි හෝ වෙනත් සංරක්ෂිත වනජීවීන්ට හානියක් නොවේය යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි වූ අතර ඒවා නියාමනය කිරීමට නිශ්චිත වැඩ පිළිවෙලක්ද නොතිබුණි.

අලිමංකඩවල් හරහා ප්‍රධාන මාර්ග වැටී ඇති ස්ථාන වලදී එම ප්‍රධාන මාර්ග හරහා අලි ගම්වැදීම පාලනය කිරීමේ පිළියමක් ලෙස මුරකුටි ඉදිකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණද, මෙම ඉදිකිරීම් ප්‍රමාදයන් නිසා මෙකී අපේක්ෂාව ඉටු වී නොතිබු බව නිරීක්ෂණය විය.

(x) වනෝද්‍යාන වලට හීලෑ ගවයින් ඇතුළු කිරීම පාලනය

-------------------------------------------------------------

උඩවලව ජාතික වනෝද්‍යානයට හීලෑ ගවයන් ඇතුළු කිරීම වැලැක්වීමේ අරමුණින් වනෝද්‍යානයේ දකුණු මායිමේ පිහිටි විදුලි වැටට සමාන්තරව කි.මී.17 ක ද්විත්ව විදුලි වැටක් රු.මිලියන 5.68 ක් වැයකර ඉදිකර තිබුණි. එසේ වුවත් වනෝද්‍යානයට පිටස්තර ගවයින් ඇතුළුවීම වැළකී නොතිබීමෙන් පූර්වෝකත අරමුණු ඉටු වී නොතිබුණි.

3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

මලලආර කුඩා ඉදිවැව විදුලි වැට මාර්ගය (26 KM) ඉදිකිරීමේදී වනජීවි කාර්යාලයේ නිලධාරීන්ගේ අයථා බලපෑම් නිසා කටයුතු අඛණ්ඩව කිරීමේ අපහසුතාවයක් ඇතිවී තිබෙන බව කොන්ත්‍රාත්කරු විසින් පැමිණිලි කර තිබුණු නමුත් අදාල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.8 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහවැලි G කලාපයට යවා තිබු රු.466,000 ක් වු දැව කදන් 270 ක් 2012 ජුනි 20 දින ගිනිගෙන විනාශවී තිබුණි.

(ආ) විදුලිවැට ඉදිකිරීම සඳහා ලබාගෙන තිබුණු දැවකණු 28 ක් ප්‍රමිතියෙන්තොර වු නමුත් ඒ සඳහා රු.59,576 ක් ගෙවා තිබුණි.

3.9 කළමනාකරණ දුර්වලතා

----------------------------

3.9.1 අලිඇතුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

-----------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වනජීවි සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව එම දෙපාර්තමේන්තුව 2014 සැප්තැම්බර් අවසානය දක්වා අලි ඇතුන් 359 ක් සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණි. මෙයින් විහාරස්ථානවල, සත්ව උද්‍යානවල සහ ගෘහස්ථව සිටින අලි

ඇතුන් පිළිබඳ වෙනම ලේඛන, දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. ගෘහස්ථව සිටින බවට කරුණු දක්වා ලියාපදිංචි කර තිබුණු අලි ඇතුන් 14 දෙනෙකු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ලිපිගොනු විගණනය විසින් පරීක්ෂා කළ අතර අනාවරණය වූ ප්‍රධාන අක්‍රමිකතා පහත දැක්වේ.

(i) ගෘහස්ථව සිටින ඇතින්නක් ගැබ් ගැනීම පිළිබඳව 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනතේ 10 හා 22 (9) වගන්ති අනුව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කර නොතිබුණි.

(ii) අලි පැටවුන්ගේ උපත ලේඛන ගතවී නොතිබීම සහ පනතට අනුව මියගිය අලි ඇතුන් පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තාකර නොතිබුණි.

(iii) අලි පැටවුන්ගේ උපත සනාථ කර ග්‍රාම නිලධාරී සහතික ව්‍යාජ ලෙස සකස් කර තිබුණි.

(iv) ව්‍යාජ දිවුරුම් ප්‍රකාශ හා අයිතිය දැක්වෙන ලේඛන ඉදිරිපත් කර තිබුණි.

(v) දෙපාර්තමේන්තු නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබීම හා ඇතැම් වාර්තා වංචනිකව ඉදිරිපත් කර තිබුණි.

(vi) විධිමත් පරිදි හා පිළිගත හැකි ආකාරයට ඩී.එන්.ඒ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(vii) කලින් ලියාපදිංචි කර තිබුණු අලි ඇතුන්ගේ ලිපි ගොනු වංචනික ලෙස වෙනස් කර අලි පැටවුන් ලියා පදිංචි කර තිබුණි.

(viii) අලි ඇතුන්ගේ උපතේදී ප්‍රතිකාර කළ වෛද්‍යවරුන්ගේ විස්තර හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

ඉහත කරුණු අනුව පරීක්ෂා කළ සියළු ලිපිගොනුවලට අදාල ඇතුන් නීති විරෝධී ලෙස කැලයෙන් අල්ලා ලඟ තබාගෙන පසුව ලියාපදිංචි කර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ද (රිට් 625/09 නඩුව) ආඥා පනත අනුව ද ලියාපදිංචි නොකළ අලි ඇතුන් සන්තකව තබාගෙන ඇති පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර හීලෑ අලි ඇතුන් සම්බන්ධව කටයුතු කිරීමට මාර්ගෝපදේශයන්ද සැකසිය යුතුය. එසේ වුවත්, අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය, විශේෂයෙන් ලේඛනවල ආරක්ෂාව සම්බන්ධව ගෙන තිබුණු ක්‍රියාමාර්ග ඉතා දුර්වල තත්ත්වයක

පැවැතුණි. මෙම හේතුව නිසා අලි ඇතුන් ලියාපදිංචිය සටහන් කිරීමට පවත්වාගෙන ගිය ලේඛන 06 ක් අතරින් එක් ලේඛනයක් අස්ථානගත වී තිබුණි.

(ඇ) අලි ඇතුන් ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදයෙහි දක්නට ලැබුණු දුර්වලතාවයන් පහත පරිදි විය.

(i) ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් නිකුත් කිරීමේදී අදාල ගාස්තු ගෙවීමෙන් පසු අයදුම්පත් නිකුත් කිරීමට ක්‍රමවේදයක් යොදා නොතිබුණි.

(ii) ලියාපදිංචි කිරීමේදී ඉදිරිපත් කළ යුතු අලි ඇතුන්ගේ ඡායා රූපයේ අලියා හඳුනා ගැනීම සඳහා ඡායා රූපයේ අන්තර්ගත විය යුතු අංග නිශ්චිතව සඳහන් කර නොතිබුණි. (උදාහරණ- අලියාගේ කන, වලිගය, හොඬය, පැහැදිළිව හඳුනාගත හැකි පරිදි )

(iii) නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයේ හා වාර්ෂික බලපත්‍රයෙහි අලවා ඇති ඡායා රූපය ගලවා වෙනත් ඡායා රූපයක් ඇලවිය නොහැකි පරිදි ඡායා රූපයට සීල් තැබීම හෝ වෙනත් ආරක්ෂිත ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

(iv) ලියා පදිංචි කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන විට ලියාපදිංචි සහතිකය හා වාර්ෂික බලපත්‍රය නිකුත් කරන දිනය වන විට අදාල අලි ඇතුන්ගේ සත්‍ය වයස, උස, ඉදිරි පාදයේ වට ප්‍රමාණය අදාල සහතිකවල ඇතුළත් නොකර අයදුම්පතේ සඳහන් තොරතුරු ඇතුළත් කර තිබුණි.

(v) අලි ඇතුන් සඳහා භාවිතා කරන නම් ලියාපදිංචි සහතිකයේ හා වාර්ෂික බලපත්‍රයේ ඇතුළත් කර නොතිබුණි.

(vi) වාර්ෂික බලපත්‍රය වසරක් පසා බලපත්‍ර ගාස්තු ගෙවා දීර්ඝ කළ යුතු වුවද, වාර්ෂික බලපත්‍ර කාලය දිර්ඝ කිරීමේදී ඒ සඳහා ඉල්ලුම් කර දිනයට අලි ඇතුන්ගේ උස, වයස, ඉදිරි පාදයේ වට ප්‍රමාණය හා වෙනත් කැපී පෙනෙන ලක්ෂණ ආදිය තොරතුරු සමඟ අයදුම්පත්‍රයක් ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මේ සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දී නොතිබුණි. වාර්ෂික බලපත්‍ර ගාස්තු ලබා ගැනීමේදී මුදල් ලබා ගැනීමේ කුවිතාන්සියේ හෝ මුදල් ගෙවීමේ වවුචරය අලි ඇතුන්ගේ ලියාපදිංචි අංකය හෝ කුමන අලියා වෙනුවෙන් මුදල් ගෙවන්නේද යන්න හඳුනාගත හැකි පරිදි විස්තර අතුළත් කර නොතිබුණි. වාර්ෂික බලපත්‍ර කාලය දිර්ඝ කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලියවිලි නිශ්චිතව සඳහන් කර නොතිබුණි.

(vii) බලපත්‍ර දිර්ඝ කිරීමේදී දීර්ඝ කළ බවට සහතිකයක් නිකුත්කර නොමැතිවීම හා ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණි.

3.9.2 ස්වාභාවික රක්ෂිතයන් ආරක්ෂා කිරීම
----------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නුවරඑළිය -අඹේවෙල මාර්ගයේ නුවරඑළිය - අඹේවෙල සත්ව ගොවිපල ආරම්භයේ සිට කිලෝමීටර් 02 ක් පමණ ප්‍රමාණයක් හග්ගල දැඩි ස්වභාව රක්ෂිතයෙන් ,අඹේවෙල සත්ව ගොවිපල විසින් අනවසරයෙන් භුක්ති විදීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) හග්ගල දැඩි ස්වභාව රක්ෂිත භූමියේ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 116 ක්ද, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 103ක්ද ,වාර්තා වි තිබු අතර, පරිසර සංවේදී ප්‍රදේශයන් වන මෙම රක්ෂිත රැකගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග එනම් අනවසර අත්පත් කර ගැනීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සීමාසහිත පාරිසරික පදනම මඟින් අභියාචනාධිකරණයේදී ගොනුකරන ලද නඩුවකට අදාලව හග්ගල දැඩි රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් නවතාලීම, අනවසර පදිංචිකරුවන් අධිකරණයට ඉදිරිපත්කර ඉවත් කිරීම, හග්ගල දැඩි රක්ෂිතයේ මායිම් සලකුණු කිරීම, අනවසර පදිංචිකරුවන් සඳහා විදුලි පහසුකම් ලබා නොදීම, දැඩි රක්ෂිත ප්‍රදේශයේ අනවසර වගා කටයුතු සඳහා තවදුරටත් බලපත්‍ර නිකුත් කිරීම හෝ දීර්ඝ කිරීම හෝ අළුත් කිරීම අත්හිටුවීම යන නියෝග ක්‍රියාත්මක කිරීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාකර නොතිබුණි.

3.10 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 23 | 33 |
| (ii) | තෘතියික මට්ටම | 32 | 26 | 6 |
| (iii) | ද්විතියික මට්ටම | 1,401 | 891 | 510 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 426 | 325 | 101 |
| | එකතුව | 1,915 | 1,265 | 650 |